# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2101/14 - 2018 දෙසැම්බර් මස 10 වැනි සඳුදා - 2018.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේකම්ගේ අංකය :* PTB/LND/ACQVE/7/38.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අංකය:* 4-3/ 15 /2016/PC/432.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ වැලිව ගමේ පිහිටි රදාගෙවත්ත සහ කටුආනගෙවත්ත නැමති ඉඩමේ (මොරවකවත්ත) අ.ග.පි. 10 හි අතිරේක අංක 88 හි පත්‍ර අංක 102 හි මාතර මැනුම් අධිකාරී මගින් පිළියෙල කරන ලද අංක MR/ PTB/2018/164 සහ 2018/03/15 දිනැතිව මා වෙත ඉදිරිපත් කරන ලද අවසාන ගම් පිඹුරේ කැබලි අංක 1671 ට මායිම්.

01. කැබලි අංක 1671

ඉඩමේ නම: මොරවකවත්ත (රදාගෙවත්ත සහ කටුආනගෙවත්ත); ප්‍රමාණය: හෙක්. 2.0234.

*මායිම්:*

උතුරට: කැබලි අංක 81, 76 සහ මාර්ගය; නැගෙනහිරට: කැබලි අංක 76, 81 සහ මාර්ගය; දකුණට: කැබලි අංක 81 සහ මාර්ගය; බටහිරට: කැබලි අංක 81.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 පෙබරවාරි මස 20 වැනි දින පෙ.ව. 10.00 ට පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 පෙබරවාරි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. ආර්. ජයනාත්,
ප්‍රාදේශීය ලේකම්,
පිටබැද්දර.

2018 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 716


1A - G 29070 - 37 (2018/12)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම අවලංගු කිරීම

*මගේ යොමු අංකය* :-4/1/1/32-E.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :-4-3/7/2015/HW/69.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 2086/5 හා 2018.08.27 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මා විසින් පල කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දැන්වීම, මෙම නිවේදනයෙන් අවලංගු කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දැනුම් දී සිටිමි.

**උපලේඛනය**

මූලික පිඹුරු අංක කු 2402 හා 2018.06.29 දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 4 දක්වා වූ ඉඩම් කොටස්.

ඊ. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018.11.30
කුරුණෑගල,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

12 - 717/ 1

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම අවලංගු කිරීම

*මගේ යොමු අංකය* :-4/1/1/32-D.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :-4-3/7/2015/HW/302.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2074/36 හා 2018.06.07 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මා විසින් පල කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දැන්වීම, මෙම නිවේදනයෙන් අවලංගු කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දැනුම් දී සිටිමි.

**උපලේඛනය**

මූලික පිඹුරු අංක කු 2394 හා 2018.05.16 දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 5 දක්වා වූ ඉඩම් කොටස්.

ඊ. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018.11.30
කුරුණෑගල,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

12 - 717/ 2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.